
## 1.1 හැඳින්වීම

"නූතන සමාජය තුළ ප්‍රචලිතව පවත්නා කලා මාධ්‍ය අතරින් සිනමාව මෙනෙවින් වැදගත් වන්නකි. සෙසු තරඟකාරී කවර මාධ්‍යයක් බිහි වූවත් එම අභියෝගවලින් සිනමාව මුළුමනින්ම යටපත් කර දමන්නට නොහැකි වී ඇති අයුරු පෙනේ. ඒකාකාරී දිවිපෙවෙතක් හා විවිධාකාර ජීවන ගැටලු හේතු කොටගෙන විඩාවට පත්වන මිනිසාගේ මනසට සුවයක් හා විනෝදයක් දනවන සිනමාව අද වඩාත් ජනප්‍රසාදයට ලක්වන කලා මාධ්‍යයක් වී ඇත්තේ එය විද්‍යමාන වන මෙකී ස්වභාවය නිසා යැයි කිව හැකිය."[01]

සිනමාව යනු දෘශ්‍ය යාන්ත්‍රික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසට ඇසෙමින් යථාර්ථයේ ප්‍රතිනිර්මාණයක් ලෙසින් සිනමාව හඳුන්වයි. අධ්‍යක්ෂකවරයාගේ පරිකල්පනයෙහි හට ගන්නා වස්තු බීජයක් යාන්ත්‍රික ක්‍රියාවලියක් ඔස්සේ පුළුල් තිරය මත ගොඩනගන රූපාවලිය සිනමාව ලෙසින් හඳුනා ගැනීමට පුළුවන. යාන්ත්‍රිකව සිදු කෙරෙන යථාර්ථයේ ප්‍රතිනිර්මාණය කෙරෙහි බොහෝ පිරිසක් විශ්වාසය තබයි. චිත්‍රපටය යන කලා මාධ්‍යය අන් කලාවනට සාපේක්ෂව ඉතා වේගයෙන් මිනිසාට සමීප වීමට ඉහත ක්‍රියාවලින් මූලික වූවා යැයි සිතිය හැක.

සිනමාව යන්න ලෝකයට බිහිවී කෙටි කලක් ඇවෑමෙන්, එය ලෝකයේ විවිධ රටවලට සංක්‍රමණය විය. ලාංකේය රාජ්‍යයට සිනමාව පැමිණෙන ලද්දේ ද ඉහත ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙසිනි. මුල්කාලීනව ලාංකේය සිනමාව ඉන්දීය සිනමාවේ කොපියක් විය. මෙම තත්වයන් මග හරිමින් ස්වාධීන සිනමා කලාවක් බිහිවීම කෙරෙහි බොහෝ වෙර දැරීමට මෙරට සිනමා අධ්‍යක්ෂකවරුනට සිදුවිය. තම මනසෙහි නිර්මාණය වන රූපාවලිය සොයමින් නිතුවක්කාර අධ්‍යක්ෂකවරුන් කැමරාව රැගෙන චිත්‍රාගාරයෙන් බැහැර වන්නට විය. අපූර්ව වූ සෞන්දර්යයෙන් පොහොසත් රූප රාමු තිරය මත ගොඩ නැගීමට මෙම නිතුවක්කාරකම සමත් විය.

සිනමාව මූලික ධාරාවන් කිහිපයක් යටතේ වර්ගීකරණයට භාජන කළ හැකිය.




01. සිල්වා චන්ද්‍රසේන.(1997). [illegible]

අන් සිනමා ධාරාවකට සාපේක්ෂව වැඩි අවධානයක් විකල්ප සිනමා ධාරාවට යොමු වේ. අපිරිසිදු රූපරාමු සම්මත කැමරා කෝණ මගින් බැහැරව ගොඩනගමින් සමාජයේ ප්‍රබල හැඟීම් සමූහයක් රූප අතර සිරකරන රැඩිකල් ධාරාවක් ලෙස විකල්ප සිනමා ධාරාව හඳුනා ගැනීමට පුළුවන. "**Underground නොහොත් විකල්ප චිත්‍රපට ජීවයේ ස්වභාවය (Style) ශානරයන්ගෙන් (Genres) සහ මූල්‍ය පෙදෙම් වලින් (Financing) ප්‍රධාන ධාරාවේ චිත්‍රපටවලට විරුද්ධාර්ථ ස්වභාවයක් පෙන්නුම් කරයි.**"[12]

අන් කලා මාධ්‍යයකට සාපේක්ෂව චිත්‍රපට කලාව වඩා ඉතා ඉක්මනින් ප්‍රේක්ෂකයා ආකර්ෂණය වේ. යම් චිත්‍රපටයක් කෙරෙහි ප්‍රේක්ෂක අවධානය ඔබ්බෙන් යොමුවීම කෙරෙහි එහුළ නිරූපිත සමාජ භාවිතාවක් ප්‍රබල ලෙස ඉවහල් ය. "**ආකෘති නයිට් නමැති විචාරකයා පැහැදිලි කළ ආකාරයට කොමියුනිස්ට්වරුන්ට හැම කලාවකටම වඩා වැදගත් වූයේ චිත්‍රපට කලාවය.**"[13]

විකල්ප චිත්‍රපට ධාරාව කෙරෙහි ඉතා සීමිත ප්‍රේක්ෂකාගාරයක් නිර්මාණය වේ. ඒ චිත්‍රපටයෙහි නිරූපිත සිතුවම්කාර, රැඩිකල් රූපරාමු කෙරෙහි පෙම් බඳින්නන්ය. එමෙන් කෙරෙහි වැඩි ඇල්මක්, ලෙන්ගතුභාවයක් දැක්වූවේ හෘදයාංගම භාවය සහ හදවත තදින් විනිවිද යන්නෙහි. එය සමාජයේ විශාල බලපාන යම්කිසි අගුරේ සමාජ ගතිකයන් පවතින නිසාවෙනි. එය විකල්ප සිනමාව වඩා ඒකරාශී වන ප්‍රේක්ෂක පිරිසට ද පොදුය. මේ අනුව විකල්ප සිනමාව වඩා ප්‍රේක්ෂකයා ඒකරාශී වීම කෙරෙහි බලපාන සමාජ, සංස්කෘතික සාධකයන් කෙබඳුද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

තවද මෙම පර්යේෂණය නවමු ලෙසින් සිනමාවට ප්‍රවිෂ්ට වන්නන් මෙන්ම සිනමාව හදාරන්නන්ට ද වැදගත් වේ යැයි සිතන අතර, ප්‍රසංග කලා හදාරන විද්‍යාර්ථයෙකු වශයෙන් මගේ ඉදිරි අධ්‍යයන කටයුතු සාර්ථක කරන සවිමත් පදනමක් ලෙස මෙම පර්යේෂණය මූලාරම්භයක් බවට පත්කර ගැනීමට ද මම බලාපොරොත්තු වෙමි.

---

12. ප්‍රසන්න කුමාර, සංජීව. (2008), **Jump Cut රූපක**, ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ
13. චිත්‍රපටය (2006). සිංහල විශ්වකෝෂය. සංස්කෘතික දෙපාර්තමේන්තුව. පිටුව 202